පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ඉණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

**பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 290**
**அரசாங்க தகவல் திணைக்களம்**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களையும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்கு சமர்பித்தல்.

**Parliamentary Series No: 290**

**Department of Government Information**

Submission of Observations of Hon Minister and steps taken with regard to the reports tabled by the Committee On Public Accounts in terms of Standing Order No.119(4)

අංක 119(4) දරණ ස්ථාවර නියෝග පරිදි රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද වාර්තාවේ නිරීක්ෂණ හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ග්‍රන්ථමාලා අංකය : 290

ආයතනයේ නම : රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

| 2021 වර්ෂය සඳහා මූල්‍ය හා කාර්යසාධන ඇගයීමේ දී හඳුනාගත් අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය |
|---|---|
| 01. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | දෙසැම්බර් 15ට පෙර ඉදිරි වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කර ඇත. (2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලස්ම 2023 වර්ෂයේ දෙසැම්බර් 15ට පෙර සකස් කර ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගෙන ඇත.) |
| 02. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | අංශවලින් පිළිතුරු ලබා ගැනීමේදී යම් යම් ප්‍රමාදයන් සිදු වන අතර මේ වන විට අතුරු පිළිතුරක් හෝ මසක් තුළ යැවීමට කටයුතු කර ඇත. |
| 03. මු.රෙ.134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණකවරයෙකු නොසිටි බැවින් අභ්‍යන්තර විගණන වාර්තා කිසිවක් නිකුත් කර නොමැත. මේ වන විට අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ඇති අතර නිසි පරිදි කටයුතු සිදු කරමින් පවතී. |
| 04. විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2ක් වත් පවත්වා නොතිබුණි. | දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබූ බැවින් විගණන හා කළමනාකරණ කමිටු නොපවත්වන ලදී. මේ වන විට අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ඇති අතර නිසි පරිදි කටයුතු සිදු කරමින් පවතී. |
| 05. 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021.12.31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා 2023.06.12 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී. |

| | |
|---|---|
| 06. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලට අදාළව විසඳුම් ලබා ගෙන අවසන් කිරීමට කටයුතු කරමින් පවතී. |
| 07. සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | සියලුම වාහන වල අයිතිය දෙපාර්තමේන්තුව නමට පවරා ගැනීමට කටයුතු කර ඇත. ලියාපදිංචි මුල් පිටපත් ලබා ගෙන ඇත. |
| 08. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් වාර්තා හා මාසික සාරංශ වාර්තා විගණකාධිපති වෙත 2023 වර්ෂයේදී යවා ඇත. |
| 09. සියලු වාහනවල රාජය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | 2023.08.25 දින සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත. |
| 10. වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට එම කටයුතු ආරම්භ කර ඇත. |
| 11. රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට මු.රෙ. ප්‍රකාරව කටයුතු කර ඇත. |
| 12. 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි. | 2022 සිට ආයතනයේ වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව පිළිබඳව කටයුතු කරමින් සිටී. |
| 13. බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි. | මේ වන විට සියලු අඩුපාඩු වහාම නිවැරදි කරමින් මාසිකව බැංකු සැසඳුම් සකස් කර ඇත. |

| | |
|---|---|
| 14. මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි. | ඇතැම් වැය විෂයන්වල පමණක් ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් ඇති කරගෙන ඇති නමුත් එම වැය විෂයන්වලට අදාළ වියදම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අනුව අනිවාර්යයෙන්ම දැරීමට සිදු විය. එම බැරකම් අතරින් බොහොමයක්, දෙසැම්බර් මස වියදම් දැරීම සඳහා ඊළඟ වසරේ ප්‍රතිපාදන භාවිත කරන බැවින් ප්‍රතිපාදන මාරු කිරීමක් සිදු නොකර ඊළඟ වසරේදී එම වියදම් දරා ඇත. වැය විෂයන් කීපයක පමණක් ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් ඇති කරගෙන තිබුණද, මෙම වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට වෙන් වී ඇති සමස්ථ ප්‍රතිපාදනය ඉක්මවා බැඳීම් හෝ බැරකම් ඇති කරගෙන නැත. |
| 15. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | **01. <u>ඕ.සී.එල් ද සිල්වා මහතා</u>**<br>අවසන් දැනුම් දීම ලෙස හොරණ ප්‍රාදේශීය ලේකම් මඟින් නිලධාරියා වෙත ණය මුදල ගෙවන ලෙස දැනුම් දුන් අතර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති මෙම ණය මුදල පිළිබඳ පෙර ගොනුව යාවත්කාලීන කිරීම ආරම්භ කිරීමට කටයුතු කරමින් සිටී.<br>**02. <u>එම්. ආර්යරත්න මහතා</u>**<br>ණය කපා හැරීමේ කටයුතු කිරීමට අදාළ නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටුව පත් කර එයට අදාළ වාර්තාව සකස් කර ඇත.<br>**03. <u>ඩබ්.ඒ.එම්.ප්‍රසංග මහතා</u>**<br>ණය මුදල අයකර ගෙන ඇත. වැටුප් හා දීමනා හිඟ මුදල් ගෙවන ලෙස නිලධාරියා දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |
| 16. පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු වනුයේ නව ඖධ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරීම් කොන්ත්‍රාත්තුවට අදාළ රඳවා ගැනීම් මුදල් වේ. අලාභ අය කිරීම් කටයුතුවලින් පසු රැඳවුම් මුදල් 2023.05.09 දින රජයේ ආදායමට බැර කරන ලදී. |

| | |
|---|---|
| 17. මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යයන්හි ස්වභාවය අනුව එම කටයුතු ඉටු කිරීමේදී වාර්තා චිත්‍රපට නිපදවීම ආදී සමහර කාර්යයන් සඳහා තරමක කාලයක් ගත වන අතර එම කටයුතු නිමවන තෙක් ලබාගත් අග්‍රිම පියවීමේ ප්‍රමාදයන් ඇති වේ. බොහෝ අවස්ථාවන්හිදී කාර්යයට අදාළ වියදම් නිම වූ වහාම ඉතිරි මුදල් පියවීම සිදු කරන අතර වාර්තා චිත්‍රපට නිපදවීම වැනි කාර්යයන්හිදී සංස්කරණය වැනි කාර්යයන් නිමකර අවසාන නිෂ්පාදනය එළි දැක්වීමට අමතර කාලයක්ද ගතවන බැවින් බිල්පත් ගොනුකර අත්තිකාරම් පියවීමේ වවුචර්පත් ඉදිරිපත් කිරීමට තරමක් ප්‍රමාද වේ. තවද, නිරතුරුවම අත්තිකාරම් ලේඛන පරීක්ෂා කරමින් නොපියවූ අත්තිකාරම් පියවන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරමින් මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. |
| 18. අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි. | අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන නොතිබූ අතර අතිරික්තයක් ලෙස පෙන්නුම් කරනුයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන 2022 දී ස්ථිර කර බඳවාගත් සංවර්ධන නිලධාරීන් සහ ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයෙන් අනුයුක්ත කරන ලද නිලධාරීන් වේ. |
| 19. කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබුණි. | 2023 වර්ෂය වන විට දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් වෙත රාජකාරී ලැයිස්තු ලබා දෙන ලදි. |
| 20. ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඇත. |
| 21. හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක සකස් කර ඇත. |
| 22. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි. | සකස්කර ඇත. |
| 23. පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය 2023 වර්ෂයේ දී සකස් කර ඇත. |
| 24. ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ පැමිණිලි හා යෝජනා සඳහා පෙට්ටියක් තබා ඇත. |

| | |
|---|---|
| 25. 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2023,2024 වර්ෂ සඳහා මානව සම්පත් සැලැස්මක් පිළියෙල කරන ලදී. |
| 26. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. | 2023 වෙන් කරන ලද ප්‍රතිපාදන හා සේවය කරන විෂය පථයට අදාළව එක් එක් නිලධාරින්ට අදාළ සේවා ව්‍යවස්ථාවන් සලකා බලා, දිය හැකි උපරිම පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කරන ලදී. |
| 27. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | සකස් කර නැත. 2024 වර්ෂයේ දී සකස් කිරීමට කටයුතු කරමි. |
| 28. මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නම් කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර ඇත. |
| 29. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2022 හා 2023 වර්ෂයන් සඳහා 40%ක පුහුණු අවස්ථා ලබා දී ඇත. |
| 30. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය. | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ නොවූ අතර 2021 වර්ෂයට අදාළව යටත්ව මතයක් ලබා දී තිබුණි. |
| 31. 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය ගිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි. | හඳුනාගෙන ඇත. |
| 32. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | කළමනාකරණ විගණන වාර්තාවේ නිර්දේශ බොහොමයක් මේ වන විට ක්‍රියාත්මක කර ඇති අතර වෙනත් ආයතනද සම්බන්ධ කරගෙන ඉටු කළ යුතු නිර්දේශ කිහිපයක් තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 33. නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි. | හානි හා පාඩු සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කෙරෙමින් පවතින අතර විමර්ශන කටයුතු අවසන් වූ පසු අය කර ගැනීමට කටයුතු කිරීමට නියමිතය. |